**<u>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 01 සේවා ගණයේ චිත්‍ර සංස්කාරක තනතුර සඳහා වන උසස්කිරීමේ පටිපාටිය</u>**

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | : | සංස්කෘතික කටයුතු |
| | යොමු අංකය | : | DCA/02/03/02/09 - I වෙළුම |
| | දිනය | : | 2022.02.22 |
| 1.2 | අමාත්‍යාංශය | : | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු |
| | යොමු අංකය | : | CA/1/1/27/17 |
| | දිනය | : | 2022.03.15 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම. | | |
| | යොමු අංකය | : | DMS/1221/ V- II |
| | දිනය | : | 2020.09.17 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | |
| | යොමු අංකය | : | EST-2/02/REC/8332 |
| | දිනය | : | 2022.01.07 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | | |
| | යොමු අංකය | : | NSCC/04/19/86/SR - III |
| | දිනය | : | 2021.10.21 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | |
| | යොමු අංකය | : | PSC/EST/07-01-03/01/2022 |
| | දිනය | : | 2022.06.21 |

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

03. සේවා ගණය පිළිබඳ විස්තර

| | | | |
|---|---|---|---|
| 3.1 | සේවා ගණය | : | කළමණාකාර සහකාර තාක්ෂණික නොවන බහු කාර්ය බණ්ඩ 01 |
| 3.2 | ශ්‍රේණි | : | III, II, I |

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක, කළමණාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වරූපයේ නොවන්නා වූද, බහුකාර්ය ස්වරූපයේ වූද, තාක්ෂණික නිපුණතා හැර වෙනත් විශේෂිත නිපුණතාවන් අවශ්‍ය වන්නා වූද, කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂ කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝෂ්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වාභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

සටහන: විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN - 2- 2016

5.2 වැටුප් පරිමාණය : රු. 28940-10x300-11x350-10x560-10 x660 -47990/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III | පියවර 01 | රු. 28,940/- |
| II | පියවර 12 | රු. 32,290/- |
| I | පියවර 23 | රු. 36,350/- |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 සේවා ගණයට අයත් තනතුරු නාම, තනතුර අනුමත ශ්‍රේණිය ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| චිත්‍ර සංස්කාරක | III,II,I | 01 | I. සිංහල විශ්වකෝෂ උද්ධෘතවලට ඇතුළත් වන චිත්‍ර, ප්‍රස්ථාර, සිතියම් ඇතුලුව සියලු ම නිරූපණ නිර්මාණය කිරීම හා සම්පාදනය කිරීම.<br>II. විශ්වකෝෂ හා උද්ධෘතවල පිටු සැකසීම.<br>III. සිංහල විශ්වකෝෂ කාර්යාලයේ උද්ධෘතවල අත් පිටපත් පිළියෙල කිරීම.<br>IV. සිංහල විශ්වකෝෂ කාර්යාලයට අදාළ වන වෙනත් චිත්‍ර, නාම පුවරු ආදිය සැකසීම.<br>V. දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන උත්සවවලට අදාළ සහතික පත්‍ර, ආරාධනා පත්‍ර, සැකසීමට අවශ්‍ය සහයෝගය අවශ්‍ය අවස්ථාවන් හී දී ලබා දීම.<br>VI. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ රාජකාරී ඉටුකිරීම. |

* දැනට සිටින නිලධාරියාට පෞද්ගලික වන සේ පමණක් මෙම තනතුර අනුමත කර ඇති බැවින්, මෙම නිලධරයා විශ්‍රාම ගැනීමත් සමඟම තනතුර ද අහෝසි වේ.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : චිත්‍ර සංස්කාරක 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ

07. බඳවා ගැනීමේ ක්‍රමය - මෙම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වාභාවය |
|---|---|---|
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | 1 වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර පහ (05)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම I) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?

වර්ෂයට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද ?

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ දී ලබා ගත යුතු ය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම :- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන බැවින් ශ්‍රේණි උසස්වීම් අදාළ නොවේ

11. තනතුරුවලට පත් කිරීම :- අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :- අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :- සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්ව නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : මෙම උසස්කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ට පමණක් අදාළ වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති MN-02-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතු ය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන :- අදාළ නොවේ

සකස් කළේ :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර:

දිනය :

මෛත්‍රීපාල සේනාරත්න
පරිපාලන නිලධාරී
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වෙනුවට
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල
2022 08 25

පරීක්ෂා කළේ :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර:

දිනය :

ඊ.ඒ.පී. ප්‍රසාද් චන්දන
සහකාර අධ්‍යක්ෂ (පාලන)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල
2022 . 09 . 16

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : T.A. Gamage

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :

තනතුර :

නිල මුද්‍රාව :

තරුණි අනෝජා ගමගේ
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

දිනය : 2022/09/28

යොමු අංකය : CA/1/1/27/17

2022.06.21 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ චිත්‍ර සංස්කාරක තනතුර සඳහා වන මෙම උසස්කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :........................................

නම :........................................

ලේකම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය : 2022/10/17

නිල මුද්‍රාව: සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල,
සෙත්සිරිපාය, බත්තරමුල්ල

---

යොමු අංකය : PSC/EST/07-01-03/01/2022

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ චිත්‍ර සංස්කාරක තනතුර සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටිය ........2022.06.21........ දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන:

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2022/11/07

නිල මුද්‍රාව එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01. විභාගයේ නම : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කළමණාකාර සහකාර - තාක්ෂණ නොවන බහු කාර්ය ඛණ්ඩ 1 නිලධර ගණය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තරය :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. දෙපාර්තමේන්තු කාර්ය භාරය පිළිබඳ දැනුම. | පැය 02 | 100 | 40% |
| II. පරිගණක පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| අදාළ ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I. දෙපාර්තමේන්තු කාර්ය භාරය පිළිබඳ දැනුම | දෙපාර්තමේන්තුව සතු වගකීම් හා කාර්යයන්, දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය, අංශ හා ඒකක, සංවර්ධන වැඩ සටහන්, චක්‍රලේඛන හා කාර්ය පටිපාටි |
| II. පරිගණක පරීක්ෂණය | තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප, වදන් සැකසුම, පැතුරුම්පත, ඉදිරිපත් කිරීම් හා රූප භාවිතය, දත්ත පාදයන්, ඊ -මේල් භාවිතය පිළිබඳ මූලික අවශ්‍යතා, අන්තර්ජාලය භාවිතය |

සකස් කළේ :

අත්සන :

නම : මෛත්‍රීපාල සේනාරත්න
පරිපාලන නිලධාරි

තනතුර : සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වෙනුවට
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල

දිනය : 2022.08.25

පරීක්ෂා කළේ :

අත්සන :

නම : ඊ.ඒ.පී. ප්‍රසාද් චන්දන

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල

දිනය : 2022.09.16

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : තරණි අනෝජා ගමගේ

තනතුර : සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

දිනය : 2022/09/28

නිල මුද්‍රාව :